යම් කිසි ජනසමාජයක සිතන පතනා ආකාරය, ආකල්ප හැඩගැස්වීම කෙරෙහි භාෂාවෙහිද විශාල දායකත්වයක් ඇති බව, ඒ සම්බන්ධයෙන් වන ප්‍රවීණයින් විසින් යෝජනා කරනා අදහසකි. ඒ අනුව, ශිෂ්ට සම්පන්න චින්තනයක් වර්ධනය සඳහා එම සමාජය මගින් ශිෂ්ට සම්පන්න භාෂාවක් යොදාගැනීම දායක වන බව ගත හැක. මෙම ශිෂ්ට සම්පන්න භාෂාව සමාජගත කිරීමෙහි ලා, මාධ්‍ය අත ඇති වගකීමද සුළු පටු නොවේ. මාධ්‍ය මගින් යොදාගන්නා භාෂාව පිළිබඳව කියවන්නන් ලෙසින් අපද සවිඥාණික විය යුත්තේ ඒ හෙයිනි.

උදාහරණයක් ලෙසින් ගත් විට, බොහෝ විට වර්තමානයේ පුවත් සිරස්තල තුළ දක්නට ලැබෙන 'ජාවාරමා', 'ජාවාරමුන්' වැනි යෙදුම් සලකා බැලිය හැක. යම් වරදකරුවන් හැඳින්වීම උදෙසා වුවද මෙවන් යෙදුම් යොදාගැනීම ඉහත දැක්වූ කරුණු අනුව බැලූ විට උචිත යැයි අපට සිතිය හැකිද? එසේ නැතිනම් ඒ සඳහා වඩාත් යෝග්‍ය වෙනත් යෙදුම් අපට යෝජනා කිරීමට හැකිද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina #Aruna**